# ක්‍රිස්තියානි ධර්මය

# DRAFT

## ගුරු මාර්ගෝපදේශය

### පළමුවන ශ්‍රේණිය

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

විද්‍යුත් තැපැල : info @ nie.lk
වෙබ් අඩවිය : www.nie.lk

# ක්‍රිස්තියානි ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

## පළමුවන ශ්‍රේණිය

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

විද්‍යුත් තැපැල : info @ nie.lk
වෙබ් අඩවිය : www.nie.lk

**ක්‍රිස්තියානි ධර්මය**

**පළමුවන ශ්‍රේණිය**

**ගුරු මාර්ගෝපදේශය**

ප්‍රථම මුද්‍රණය - 2015

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN .................

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : info @ nie.lk

*මුද්‍රණය* :

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

මෙම ගුරු මාර්ගෝපදේශය මගින් ගුරුභවතාට තම පාසල තුළ විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන මූලික දෑ සැපයේ. විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ දී ගුරුවරුන් තම කාර්යයන්, දරුවාගේ බුද්ධි වර්ධනය කෙරෙහි මෙන් ම, චර්යාත්මක දියුණුව කෙරෙහි ද දිගු කාලීන බලපෑමක් ඇති කරවන බව නිරන්තරයෙන් ම සිහි තබා ගත යුතු වේ.

ප්‍රජානන සාධන මානය සම්බන්ධයෙන්, අනෙක් කරුණු අතරට, ඉගෙනීම ඉහළ මට්ටමකට ගෙන යාමට පහත සඳහන් කරුණු කෙරෙහි ද ගුරුවරුන් සැලකිලිමත් විය යුතු වේ.

- ශිෂ්‍යයා තම ජීවිත අරමුණු පිළිබඳ අවදියෙන් සිටීම සහ කළ යුතු කාර්යය, හැකියාවන්ට සහ අරමුණු සාධනයට අදාළ වීම.
- ශිෂ්‍යයා ක්‍රියාකාරීව ඉගෙනුම් කාර්යාවලියෙහි නිරත වීම. (ඉගෙනීම සිසු කේන්ද්‍රීය ක්‍රියාවලියක් වීම.) කන්ෆියුසියස් ගේ කියමන සිහියට නගා ගන්න; ඇසෙන දේ අමතක වේ. දකින දේ අමතක නොවේ. කළ දේ ඉගෙන ගැනේ.
- ඉගෙනුම් වාතාවරණය, ධනාත්මක ව, අභියෝගාත්මක වී, ඉගෙනුම් මෙවලම්, උපකරණ, විද්‍යාගාර, විවිධ සම්පත් ආකාරවලට පිවිසුම පහසු වීම.
- ශිෂ්‍යයාට ක්ෂණික ධනාත්මක සහ නිර්මාණාත්මක ප්‍රතිචාරයන් ලබා දීම මගින්, ඉගෙනුම ක්‍රමානුකූල ව ඉහළ මට්ටමක අවශෝෂණයකින්, ශිෂ්‍යයාගේ දැනුම, කුසලතා සහ අරමුණු සමග අනුකලනයකට අවකාශ ඇති කිරීම.

අධ්‍යාපනයේ දී, රජයේ අපේක්ෂාව වනුයේ සියලු පාසල්වල සියලු දරුවන්ට, මූලික විෂය කරුණු අවශ්‍ය මට්ටමකට ග්‍රහණය කිරීමෙන්, විභාගයට මුහුණ දීමෙන් පසුව සාර්ථකත්වයේ සතුට විඳ ගැනීමේ හැකියාව ලබාදීමය.

දරුවාගේ චර්යාත්මක වර්ධනයට අදාළ මානය සලකා බැලූ විට අධ්‍යාපනයේ පරමාර්ථය වනුයේ ප්‍රජානන හැකියාවන් වැඩ ලෝකය සමග සම්බන්ධ කිරීමයි. එබැවින් ගුරුවරුන් තමතින් විෂය නිර්දේශ ලබා දීමේ දී වර්ධනය කළ යුතු වන්නේ, පාසලින් බැහැර ලෝකය සමග ගනුදෙනු කිරීමට ශිෂ්‍යයාට අවශ්‍ය වන, දක්ෂතා සහ කුසලතා ය. එයින් සමහර වැදගත් ගණීය හැකියාවන් පහත සඳහන් ක්ෂේත්‍රයන් හි වේ.

- කාර්යශීලී වැඩ ආචාර ධර්ම - සාධනීය ආකල්ප සහ නව නිර්මාණයට, සංරක්ෂණයට ඇති ලැදියාව
- අන්තර් පුද්ගල සම්බන්ධතා - කණ්ඩායම් වැඩ, විනය සහ කාර්යක්ෂම සන්නිවේදනය
- සදාචාරාත්මක හර - විවිධත්වයට ගරු කිරීම වැනි පුරවැසි වටිනාකම්වලින් හෙබි, ඍජු පුද්ගලයෙක්

අවසාන වශයෙන් මම සියලු විදුහල්පතිවරුන්ටත්, ගුරු භවතුන්ටත්, පාසල්වල අනෙක් කාර්ය මණ්ඩල සහිකයන්ටත්, ඉතා ඕනෑකමින් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය දෙස කළමනාකරණයේ ඒ 4 වශයෙන් හඳුන්වන පහත සඳහන් කරුණු මගින් තම සැලකිල්ල යොමු කරන මෙන් ඉල්ලීමට කැමැත්තෙමි. එනම් ආකල්පය, විශ්ලේෂණය, ක්‍රියාව සහ වගවීමයි. ඔබ නියුක්ත වන කාර්යයෙහි (පාඩම ආදී වශයෙන්) අවසානයත්, මාර්ගයන් පිළිබඳ අදාළ සාධනීය ආකල්පයන්ගෙන් ආරම්භ කරන්න. එය සංවිධානය කර ගැනීම උදෙසා (වරු ඒකක ආදී වශයෙන්) තොරතුරු සොයා බලා ලබාගෙන ඒවා විශ්ලේෂණය කරන්න. විකල්ප සලකා බලා ක්ෂණික ක්‍රියා (ප්‍රකාශ කිරීම, බාරදීම) කාර්යක්ෂමව ගන්න. ඔබ ප්‍රතිඵල අධීක්ෂණය, ඇගැයීම සහ මිණුම සම්බන්ධයෙන් (අයිතිය) වගකීම බාර ගන්න.

මේ හා සම්බන්ධ සියලු ගුරු භවතුන්ට, ඉගැන්වීමේ දීත්, ඉගෙනීමේ දීත් සතුට අත්වේවා යයි ප්‍රාර්ථනා කිරීමට මම මෙය අවස්ථාව කර ගනිමි. අවශ්‍ය වුවහොත් මට ද පිටපතක් සහිතව ජාතික අධ්‍යාපන ආයතනයේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට මෙම ගුරු මාර්ගෝපදේශය පිළිබඳ ඔබේ අත්දැකීම් සහ නිරීක්ෂණ ලියා දන්වා එවීමට නොපසුබට වන්න.

**මහාචාර්ය ගුණපාල නානායක්කාර**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම.

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමි ගේ පණිවිඩය

ඉගෙනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මත බැහැර කිරීමට ද, සුභාවිත තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද, මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේද හා පහසුකම් ද, අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂයමාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ සහ සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක් වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතා මෙන් ම පුරාතන උරුම ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කර ගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණ තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශය නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශවල ඉගෙනුම් ක්‍රමවේද, අකුරක් වත් වෙනස් නො කොට පිළිපැදිය යුත්තක් නම් නො වේ. විෂය නිර්දේශයෙහි තේමා සහ නිපුණතා සාධනය වීම සඳහා අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලි ව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන, ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශය ශික්ෂකයා හට ද, දෙගුරුනට ද, භාවිත කළ හැකි ය. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නො වන බව දැන ගුරු භවතුන් පෙළ පොත හා මාර්ගෝපදේශය යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයවල සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයකු වුව ද අපේක්ෂා කරන සාධන, විෂයය ඉගැන්වීමට මඟ පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමඟ ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනඟා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කර ගනු ඇතැ යි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය,**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

# විෂයමාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමැතිය :**

| | | |
|---|---|---|
| **උපදේශකත්වය** | : | ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්<br><br>ගරු ඩබ්ලිව්. පී. එබනේසර් ජෝසප් දේවගැතිතුමා<br>මහ ලේකම්, ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය<br><br>ගරු ජේ. ඒ. මිහිරි ද සිල්වා දේවගැතිතුමිය<br><br>විධායක ලේකම්, ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය<br>අධ්‍යාපන කොමිසම<br><br>ගරු කාල්ටන් ද සිල්වා පියතුමා<br>කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය<br><br>කේ. ඒ. ඩී. පී. සරත්චන්ද්‍ර මහතා<br>අධ්‍යක්ෂ (මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන) |
| **අනුමැතිය** | : | ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය |
| **විෂය සම්බන්ධීකරණය** | : | නදී අමා ජයසේකර මිය<br>අධ්‍යාපනඥ, ජාතික අධ්‍යාපන ආයතනය<br><br>කේ. ආර්. එම්. සකුන්තලා රණසිංහ මිය,<br>සහකාර කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය. |

**ලේඛක මණ්ඩලය :**

| | | |
|---|---|---|
| **අභ්‍යන්තර සම්පත් දායකත්වය** | : | නදී අමා ජයසේකර මිය |
| **බාහිර සම්පත් දායකත්වය** | : | ගරු ජේ. ඒ. මිහිරි ද සිල්වා දේවගැතිතුමිය<br>විධායක ලේකම්, ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය, අධ්‍යාපන කොමිසම.<br><br>ගරු රංජනී ලියනාරච්චි දේවගැතිතුමිය,<br>ස්වෙච්ඡා ගුරු, ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය<br><br>එම්. රදීකා සමන්ති මෙන්ඩිස් මිය,<br>ගුරු සේවය, ශාන්ත තෝමස් විදුහල, ගල්කිස්ස<br><br>එම්. පී. සෙල්වනිධි පෙරේරා මිය,<br>ගුරු උපදේශිකා (විශ්‍රාමික)<br><br>බී. ඒ. ජී. දරීජු මිය,<br>ගුරු සේවය, වෙස්ලි විදුහල, කොළඹ<br><br>ඒ. කිතුමිණි සල්ගාදු මෙනවිය,<br>ගුරු සේවය, මෙතෝදිස්ත උසස් විදුහල, කටුනායක<br><br>බී. එස්. පුෂ්පකුමාරි මිය,<br>ගුරු සේවය, කුරු/ලක්දාස් ඩි මෙල් විද්‍යාලයය |
| **භාෂා සංස්කරණය** | : | ඊ. ආර්. නිමල් ප්‍රේමකුමාර මයා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය. |

# ක්‍රිස්තියානි ධර්මය ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

කිතුනු දරුවකු ගේ ආගමික හැඟීම්වල හරය විය යුත්තේ, ඇදහිල්ල, ප්‍රීතිය හා ක්‍රිස්තුස්වහන්සේට අයත් වීමයි. සියලු යහපත් දේ දෙවි පියාණන් වහන්සේගෙන් ලැබෙන බව දැන ගැනීමෙන් ඇදහිල්ල හා ප්‍රීතිය ජනිත වෙයි. මෙහි දී නිරායාසයෙන් දෙවි පියාණන්ට ස්තුති කිරීමට හා යාච්ඤා කිරීමට යොමු විය යුතු ය. මෙම අරමුණ ප්‍රාථමික අධ්‍යාපන ක්‍රිස්තියානි විෂය නිර්දේශ හරහා දිවෙයි. මෙම අරමුණු කෙරෙහි මෙන් ම දේව නිර්මාණ වන අවට පරිසරය සුරැකීම, ආගමික වතාවත්වලට හුරු වීම සහ ආචාර ධර්ම ජීවිතවලට එකතු කර ගැනීම වැනි කරුණු කෙරෙහි ද අවධානය යොමු කරමින් මෙම විෂය නිර්දේශය සැකසී ඇත.

**ප්‍රාථමික අවධිය සඳහා වන නිපුණතා**

1. දෙවි පියාණන් වහන්සේ දුන් දීමනා සහ ලෝකය හඳුනා ගනියි, අගය කරයි, රැක ගනියි.
2. දෙවි පියාණන් වහන්සේ ගේ ආදරය හා රැකවරණය අත්දකියි, ප්‍රතිප්‍රේමය දක්වයි.
3. දේව ප්‍රේමයට ප්‍රතිචාර දක්වමින් යහපත් කිතුනු ගුණාංග වඩවා ගනියි.
4. ජේසුස් වහන්සේ හඳුනා ගනියි, අනුගමනය කරයි.
5. ජේසුස් වහන්සේ ගේ ජීවිතයේ සුවිශේෂී වටිනාකම් හඳුනා ගනියි.
6. ශුද්ධාත්මයාණන් වහන්සේ හඳුනා ගනියි.
7. දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ක්‍රියා කරයි.
8. ශුද්ධ බයිබලයට අනුව දිවි ගෙවයි.

1 - 5 ශ්‍රේණි දක්වා ප්‍රාථමික අවධියේ ක්‍රිස්තියානි ධර්මය පිළිබඳ අත්දැකීම් ලබන සිසුන්, ප්‍රාථමික අවධිය අවසාන කරන විට උක්ත නිපුණතාවලට ළඟා වීම අපේක්ෂා කෙරේ. ඒ සඳහා අදාළ විෂය අන්තර්ගතය, විෂය නිර්දේශවල දක්වනු ලබන අතර ඊට අදාළ ව ක්‍රියාකාරකම් පාදක ප්‍රවේශයකින් කටයුතු කිරීම සඳහා යෝජනා කර ඇති ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය වඩාත් නිර්මාණශීලී ව භාවිතා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් අත්දැකීම් ලබා ගැනීමේ දී ශ්‍රව්‍ය දෘශ්‍ය ආධාරකයක් ලෙස පමණක් පෙළ පොත යොදා ගැනීම සුදුසු ය.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය**

සෑම ශිෂ්‍යයකු වෙනුවෙන් ම ක්‍රිස්තියානි ධර්මය පෙළ පොතක් නිකුත් කෙරේ. ගුරු මාර්ගෝපදේශයෙන් බොහෝ ක්‍රියාකාරකම් සඳහා මඟ පෙන්වීම් කෙරේ. එහි පහත දැක්වෙන ආකාරයේ ප්‍රාථමික සිසුන්ට යෝග්‍ය ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය ඉදිරිපත් කර ඇත.

- පරිසරය හා සමඟ සම්බන්ධ වූ ප්‍රිය ජනක ක්‍රියාකාරකම් හා ක්‍රීඩා
- ආගමික වතාවත් හා සම්බන්ධ ක්‍රියාකාරකම්
- ගායන, රංගන, රූපණ, නිර්මාණ ආශ්‍රිත ක්‍රියාකාරකම්

**පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන්**

පාසල් සංස්කෘතිය හා සම්බන්ධ වැඩසටහන්වලින් ක්‍රිස්තියානි ධර්මය විෂය සම්බන්ධ නිපුණතා බොහොමයක් ආවරණය කළ හැකි ය. එසේම තහවුරු කළ හැකි ය. තව ද පාසල් සංස්කෘතිය තුළ මෙම නිපුණතා ගොඩනැගෙන නව අංග ඇති කිරීම කෙරෙහි ද විදුහල්පතිවරුන් ගේ සුවිශේෂ අවධානය යොමු කිරීම අපේක්ෂා කෙරේ.

ප්‍රාථමික පාසල සඳහා ක්‍රියාත්මක වන උදය ආගමික වැඩසටහන් මේ අතර ප්‍රධාන තැනක් ගනියි. පළමු වන ශ්‍රේණියේ දී ඉතා සරල ව අරඹා පස් වන ශ්‍රේණිය දක්වා මෙම වැඩසටහන ක්‍රමයෙන් දියුණු කරමින් විවිධ අංග එක් කළ හැකි ය.

පාසල අයත් මීසම/පළාත/දේවස්ථානය භාර දේවගැති තුමා/තුමිය හෝ ළඟ ම පිහිටි දෙව් මැඳුරක නැතහොත් ආයතනයක දේවගැති තුමා/තුමිය හෝ හමු වීමට සිසුන්ට අවස්ථාව සලසා දෙන අතර ම වාරයකට අවම වශයෙන් දෙවතාවක් වත් දෙව් මැඳුරට සිසුන් කැඳවා ගෙන යාමෙන් දෙව් පියාණන් වහන්සේ ගේ ආදර පහස විඳීමට ඔවුන්ට අවස්ථාව සැලසේ.

පවිත්‍රතාව, විනීත බව, සහයෝගය, ගුරුවරුන් කෙරෙහි පැවැත්විය යුතු ආචාර ධර්ම, ආශිර්වාද ඇසුරෙන් ගොඩ නැඟෙන සමානාත්මතාව, සුහදත්වය, සහයෝගය ආදී ලක්ෂණවලින් පාසල් පරිසරය හා සම්බන්ධ සංස්කෘතිය අලංකාර කෙරේ. ඉහත සංස්කෘතිය තුළ ක්‍රිස්තියානි ධර්මය විෂයයෙන් අපේක්ෂිත නිපුණතා වර්ධනය වන අවස්ථා උදා කළ හැකි ය. මෙ මඟින් විෂය තුළ දී ඉගෙන ගන්නා සියල්ල ප්‍රායෝගික භාවිතයට ද අවස්ථා උදා වේ.

දිනපතා පාසල ආරම්භ කිරීමේ දී හා අවසන් කිරීමේ දී කිතුනු දහමට අනුව සැකැසුණු පාසල් ප්‍රතිපත්තියක් කිතුනු පාසල්වල ක්‍රියාත්මක වේ. මේ හැර එම පාසල්වල විවිධ ආගමික උත්සව හා සම්බන්ධ වැඩසටහන් ද පවතී. එ බැවින් මෙ බඳු පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් පිළිබඳ ගුරුවරුන් මනා අවබෝධයක් ලබා ගත යුතු ය. එ බඳු වැඩසටහන් හා පාසල් ප්‍රතිපත්ති තුළ දරුවන් ජීවත් කරවමින් විෂය නිර්දේශ මඟින් අපේක්ෂිත නිපුණතා කරා සිසුන් ළඟා කරවීමට නිරතුරු ව උනන්දු විය යුතු ය.

වෙනත් ආගමික බහුතරයක් සිටින පාසලක වුව ද යාච්ඤාවක් මඟින් හෝ තම ආගම සිහි කර ගැනීමේ අවස්ථාව සලසා දීමෙන් කිතුනු දරුවන් ගේ අයිතිවාසිකම් තහවුරු වේ.

**තක්සේරු කිරීම**

ප්‍රාථමික ශ්‍රේණිවල දී ලිඛිත පරීක්ෂණ වැනි ඇගයීම්වලට වඩා ප්‍රමුඛත්වය දිය යුතු වන්නේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරු කර ගත් ඇගයීම්වලට ය. නිරීක්ෂණය, ගවේෂණය, ක්ෂේත්‍ර චාරිකා, අභිනය, නාට්‍ය, රූකඩ, සාකච්ඡා, වාචික ප්‍රශ්න වැනි ඇගයීම් මේ සඳහා උචිත වෙයි.

# පටුන

පිටුව


| | |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවුඩය | iv |
| විෂයමාලා කමිටුව | v |
| ක්‍රිස්තියානි ධර්මය ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස් | vi |
| විෂය නිර්දේශය | ix |
| ඉගෙනුම් - ඉගැන්වීම ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1 |

# විෂය නිර්දේශය

# හැඳින්වීම

ජාතික අරමුණු ඉටු කර ගැනීම සඳහා පාදක වන මූලික නිපුණතා ඇසුරින් 'ආගම සහ ආචාර ධර්මවලට අදාළ නිපුණතා' දරුවන් තුළ ගොඩනැංවීම 'ආගම' විෂයයේ වගකීම වෙයි.

කුඩා දරුවකුගේ ළපටි මනසෙහි අලුත් යමක් රෝපණය කිරීම පහසු ය, එ සේ ම යහපත් චර්යා සහ වත් පිළිවෙත්වලට කුඩා දරුවකු අනුගත කිරීම ද වඩා ඉක්මනින් කළ හැකි ය. කුඩා දරුවකු තුළ පවත්නා එම ගුණාංගවලට මනා ව ගැළපෙන සේ මෙහි විවිධ ක්‍රියාකාරකම් යෝජනා කර ඇත. විෂය අන්තර්ගතයට අනුකූල ව සිසු දරුවාට අදාළ නිපුණතාව ලබා දෙමින් ඉගෙනුම් පල සාක්ෂාත් කර ගැනීමට එම ක්‍රියාකාරකම් ඔබට මාර්ගෝපදේශයක් වනු ඇතැ යි අපේක්ෂා කෙරේ.

සමාජයක සාමය සහ සදාචාරය පවත්වා ගැනීමට සියලු ම ආගම්වලින් ලැබෙන දායකත්වය සුළුපටු නො වේ. තව ද, තමා හැම අයුරින් ම පෝෂණය කර ගුණාත්මක ජීවිතයක් ගත කිරීමට ශ්‍රම දායකත්වය සපයන මිනිස් සමාජයට කෘතවේදී වෙමින් පෙරළා අවංක සේවයක් කිරීමටත්, යහගුණවලින් හෙබි මනුෂ්‍යයකු ලෙස අභිමානයෙන් යුතු ව ජීවත් වීමටත්, ආගමකින් ලැබෙන පන්නරය අතිමහත් ය. එ පමණක් නො ව අප එකිනෙකා විශ්වාස කරන පරිදි මරණින් ඔබ්බෙහි දී ද යහපතක් උදා කර ගැනීම සඳහා ආගමික ඉගැන්වීම් අපට නිසැක ව ම පිහිට වෙයි.

දැහැමි සමාජයක් බිහි කිරීමේ උදාර කර්තව්‍යය ආරම්භ කළ යුත්තේ ප්‍රාථමික අවධියේ කුඩා දරුවා ගෙනි. ඒ මහඟු කර්තව්‍යය භාර ගෙන සිටින භාග්‍යවන්ත වූ ගුරුභවතා ඔබ යි. ඒ සඳහා ඔබෙන් ලැබෙන දායකත්වය සහ කැපවීම මහත් සේ අගයමු.

# ජාතික අරමුණු

i. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

ii. වෙනස් වන ලෝකයක අභියෝගවලට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාද හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

iii. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම සහ හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මත සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

iv. පුද්ගලයින් ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයවලට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

v. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

vi. පුද්ගලයා ගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්ය සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

vii. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවලට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

viii. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

### i. සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ හතරක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

**සාක්ෂරතාව** : සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කතා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරැදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

**සංඛ්‍යා පිළිබඳ දැනුම** : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකුල ඉලක්කම් භාවිතය

**රූපක භාවිතය** : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

**තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද, සේවා පරිශ්‍රවල දී ද, පෞද්ගලික ජීවිතයේ දී ද, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

### ii. පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගය
- චිත්තවේගී බුද්ධිය

### iii. පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරවලට අදාළ වේ.

**සමාජ පරිසරය** : ජාතික උරුම පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතාව, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යා, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදාය, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

**ජෛව පරිසරය** : සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය, ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

**භෞතික පරිසරය** : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍යය, සුව පහසුව, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම් යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා

iv. **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

- ආර්ථික සංවර්ධනයට දායක වීම
- තම වෘත්තීය ලැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම
- හැකියාවලට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියා උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

v. **ආගම සහ ආචාර ධර්මවලට අදාළ නිපුණතා**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවලට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අදාළ අගය උකහා ගැනීම හා ස්වීයකරණය


vi. **ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**


සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටා තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

vii. **ඉගෙනීමට ඉගෙනුම පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස් වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත්, ස්වාධීන ව ඉගෙන ගැනීමත්, සඳහා පුද්ගලයින්ට ශක්තිය ලබා දීම

# ප්‍රාථමික විෂයමාලා සැලැස්ම



# කාලය බෙදා ගැනීම

## පළමු වන ප්‍රධාන අවධිය (පළමු වන සහ දෙ වන ශ්‍රේණි)

| | **විෂයය** | **සතියකට වෙන් කර ඇති කාලය** |
|---|---|---|
| 1. | මවු බස | පැය 5.00 |
| 2. | ගණිතය | පැය 3.30 |
| 3. | පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් | පැය 5.30 |
| 4. | ආගම | පැය 1.15 |
| 5. | දෙවන ජාතික භාෂාව | මිනිත්තු 30 |
| 6. | උදය රැස්වීම සහ ආගමික වතාවත් | පැය 1.15 (දිනකට මිනිත්තු 15 බැගින්) |
| 7. | විවේක කාලය | පැය 1.15 (දිනකට මිනිත්තු 15 බැගින්) |
| 8. | ආහාර ගැනීම සඳහා | මිනිත්තු 50 (දිනකට මිනිත්තු 10 බැගින්) |
| 9. | ශරීර සුවතා ක්‍රියාකාරකම් | පැය 1.40 (දිනකට මිනිත්තු 20 බැගින්) |
| 10. | විෂය සමගාමී ක්‍රියාකාරකම | මිනිත්තු 30 (සතියේ එක් දිනෙක) |
| | **සතියක මුළු කාලය** | පැය 21.15 |

# විෂය අරමුණු

1. සමාජයේ ගෞරවාදරයට බඳුන් වන කිතුනු ප්‍රතිපත්ති ඇති ඇදහිලිවන්ත දරුවකු බිහි කිරීම
2. ශුද්ධ බයිබලය යනු දේව වචනය බව දැනුවත් කරමින් ශුද්ධ බයිබලයට අනුකූල ව ජීවත් වීමට දිරි ගැන්වීම
3. දෙවි පියාණන් වහන්සේ සමඟ ආත්මික සබඳතාවක් ගොඩනඟා ගැනීමට පුරුදු පුහුණු කිරීම
4. ජේසුස් වහන්සේ තම ජීවිතයේ ගැලවුම් කරුවාණන් බව පෙන්වා දීම
5. ශුද්ධාත්මයාණන් වහන්සේ ලෝකය තුළ වැඩ වෙසෙමින් නිරන්තරයෙන් තමාට මඟ පෙන්වතැයි යන විශ්වාසය ගොඩනැංවීම
6. ශුද්ධ බයිබලයෙන් හමු වන ශ්‍රේෂ්ඨ චරිතවල උදාර ගුණ ජීවිතයට උකහා ගැනීමට මඟ පෙන්වීම
7. දේව තිළිණයක් වූ පරිසරය ආරක්ෂා වන සේ ද, සකසුරුවම් ලෙස ද, පරිහරණය කරමින් තව දුරටත් සංවර්ධනය කර ගැනීමේ ආකල්ප ජනිත කිරීම
8. ස්වභාව ධර්මය හා තමා අවට ජීවත් වන අය තුළින් දේව ආදරය අත් විඳීමට සහ ප්‍රතිප්‍රේමය දැක්වීමට අවස්ථා සම්පාදනය කිරීම
9. සියල්ලන්ට ම ප්‍රේම කරමින් කණ්ඩායමක් තුළ එකමුතු ව සමඟියෙන් කටයුතු කිරීමේ කුසලතා රෝපණය කිරීම
10. අන්‍යාගම්වලට ද ගරු කරමින් සාමයෙන් හා සහයෝගීතාවෙන් යුතු ව ජීවත් වීමේ වැදගත් ගුණාංග වර්ධනය කිරීම

| තේමාව | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| 1.0 දෙවි පියාණන් වහන්සේ දුන් දීමනා | 1.0 දෙවිපියාණන් වහන්සේ දුන් දීමනා සහ ලෝකය හඳුනා ගනියි, අගය කරයි, රැක ගනියි. | 1.1 මිනිස් සිරුර දේව මැවිල්ලකි.<br>• දැස් - ලස්සන දැකීම<br>• දෙකන් - විවිධ ශබ්දවලට සවන් දීම<br>• දැත් දෙපා - යහපත් ක්‍රියා සඳහා යොදා ගැනීම<br>• දිව - රස බැලීම හා හොඳ වචන පැවසීම<br>• නාසය - දුගඳ හා සුවඳ දැන ගැනීම<br>(ගීතාවලිය 8 : 5 - 6) |
| | | 1.2 පොළොව, අව්ව හා වැස්ස (උත්පත්ති 1:1)<br>(ගීතාවලිය 19 : 6), (ජෝබ් 36 : 27 - 28)<br>(ගීතාවලිය 104: 5, 14) |
| | | 1.3 මල් සහ ගස්වැල්<br>(උත්පත්ති 1 : 11 - 13) |
| 2.0 දෙවි පියාණන් වහන්සේ ගේ ආදරය හා රැකවරණය | 2.0 දෙවි පියාණන් වහන්සේ ගේ ආදරය හා රැකවරණය අත්දකියි, ප්‍රතිප්‍රේමය දක්වයි. | 2.1 දෙමව්පියන් සහ රැකබලා ගන්නන් ගේ ආදරය |
| | | 2.2 සහෝදර සහෝදරියන් ගේ ආදරය |
| | | 2.3 නෑදෑ හිත මිතුරන් ගේ ආදරය |
| | | 2.4 ගුරුවරුන් ගේ ආදරය |
| 3.0 දේව ප්‍රේමයට ප්‍රතිචාර දැක්වීම | 3.0 දේව ප්‍රේමයට ප්‍රතිචාර දක්වමින් යහපත් කිතුනු ගුණාංග වඩවා ගනියි. | 3.1 යහපත් කිතුනු ගුණාංග |
| 4.0 ජේසුස් වහන්සේ හඳුනා ගැනීම | 4.0 ජේසුස් වහන්සේ හඳුනා ගනියි. අනුගමනය කරයි. | 4.1 මරිය තුමියට ලැබුණු දේව පණිවුඩය<br>(ශු. ලූක් 1 : 31) |
| | | 4.2 ජේසු උපත (ශු. ලූක් 2 : 4 - 7) |
| | | 4.3 • එඬේරුන් ජේසු සමිඳුන් නැමදීම<br>(ශු. ලූක් 2 : 8 - 20)<br>• ශාස්ත්‍රවන්තයන් ගේ පැමිණීම<br>(ශු. මතෙව් 2 : 7 - 12) |

| තේමාව | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| **5.0 ජේසුස් වහන්සේගේ ජීවිතයේ සුවිශේෂ වටිනාකම් හඳුනා ගැනීම** | 5.0 ජේසුස් වහන්සේගේ ජීවිතයේ සුවිශේෂ වටිනාකම් හඳුනා ගනියි. | 5.1 පන්දහසකට කන්නට දීම (ශු. ජොහන් 6 : 1 - 14) |
| | | 5.2 තනි ව දෙවි පියාණන් වහන්සේට යාච්ඤා කරයි. (ශු. මාක් 1 : 35) |
| **6.0 ශුද්ධාත්මයාණන් වහන්සේ** | 6.0 ශුද්ධාත්මයාණන් වහන්සේ හඳුනා ගනියි. | 6.1 ශුද්ධාත්මයාණන් වහන්සේ (රෝම 8 : 26 A , ගලාති 5 : 16 A) |
| **7.0 දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ක්‍රියා කිරීම** | 7.0 දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ක්‍රියා කරයි. | 7.1 සමගියෙන් ජීවත් වීම. (ශු. ලූක් 10 : 30 - 37) |
| | | 7.2 තමන් සතු දේ බෙදා ගැනීම (ශු. ලූක් 10 : 33 - 35) |
| | | 7.3 බේද නො තකා එකිනෙකා රැකබලා ගැනීම (ශු. ලූක් 10 : 35 - 37) |
| **8.0 ශුද්ධ බයිබලය ජීවිතයට අදාළ කර ගැනීම** | 8.0 ශුද්ධ බයිබලයට අනුව දිවි ගෙවයි. | 8.1 පැරණි ගිවිසුමේ කතන්දර - දාවිත් (ගීතාවලිය 145 : 1-2) (1 : සාමුවෙල් 16 : 17-23) |
| | | 8.2 නව ගිවිසුමේ කතන්දර - රාජ්‍ය නිලධාරියාගේ පුතා සුව කිරීම (විශ්වාසය) (ශු. ජොහන් 4 : 46 - 51) |
| | | 8.3 මරණය පරදා උත්ථාන වූ ජේසුස් වහන්සේ (ශු. මතෙව් 28 : 1 - 8) |

# ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

## 1.0 තේමාව : දෙවි පියාණන් වහන්සේ දුන් දීමනා

**1.0 නිපුණතාව : දෙවියන් වහන්සේ දුන් දීමනා සහ ලෝකය හඳුනා ගනියි, අගය කරයි, රැක ගනියි.**

**ඉගෙනුම් පල** : 1.1

- දෙවියන් වහන්සේ මැවූ ශරීරාංග රැකගත යුතු බව ප්‍රකාශ කරයි.
- ශරීරාංග මැවූ දෙවිඳුන්ට තුති පිදීම සඳහා එකමුතු ව රඟමින් ගීතිකාවක් ගායනා කරයි.

**ඉගෙනුම් සම්පත් :**

- ශු. බයිබලය - ගීතාවලිය 8 : 5 - 6
- බෝනික්කෙක්
- ගීතිකාව (ක්‍රිස්තියානි ගීතක පොතේ අංක 573)
- කිතුනු ගීත කැසට් පටය සහ වාදන යන්ත්‍රය
- වර්ණ ගැන්වීම සඳහා ළමයකුගේ රූපයක්

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :**

පියවර 1 :

- සිසුන් ඉදිරියේ බෝනික්කකු ප්‍රදර්ශනය කරමින් මිනිස් ශරීරයේ ඇස්, කන්, නාසය, දෑත්, දෙපා ආදී අංගෝපාංග හඳුන්වන්න.
- එම ශාරීරික අවයව සහිතව දෙවියන් වහන්සේ මිනිසා මවා තිබෙන නිසා අපට සතුටින් පහසුවෙන් හා අර්ථවත් ලෙස ජීවත් විය හැකි ආකාරය සිසුන් සමග සාකච්ඡා කරන්න.
- අපට දී ඇති අවයව වලින් ප්‍රකාශ වන්නේ දෙවි පියාණන් වහන්සේගේ ආදරය බව තහවුරු කරන්න.
- දෙවිඳුන් දුන් ශරීරය අගය කරමින් එය රැක ගැනීමට දිරි ගන්වන්න.

පියවර 2 :

- ක්‍රිස්තියානි ගීතිකා පොතේ අංක 573 ගීතිකාවේ මුල් පද 5 කැසට් පටයක් යොදා ගනිමින් වාදනය කරන්න. (නැතහොත් ගායනා කරන්න.)
- ගීතිකාව තාලයට ගායනා කරමින් රඟ දැක්වීමට සිසුන් යොමු කරන්න.
    1. **මේ ලොව ඇති සැම දේ ම මවා දුන් පිය දෙවිඳුන් හට (තුති දී වඳිමු //)**
    2. **ලස්සන පාටැති මල් හැම බලනට - ඇස් දුන් දෙවිඳුට (තුති දී වඳිමු //)**
    3. **මිහිරි කුරුලු ගී හඬ නිති අසනට - කන් දුන් දෙවිඳුට (තුති දී වඳිමු //)**
    4. **අප හැම වැඩ පල සොඳ සේ කරනට - අත් දුන් දෙවිඳුට (තුති දී වඳිමු //)**
    5. **දුව පැන සිත් සේ සෙල්ලම් කෙරුමට - පා දුන් දෙවිඳුට (තුති දී වඳිමු //)**

පියවර 3 :

- දෙවි පියාණන් වහන්සේ තමාට හිමි කර දුන් ශරීරය වර්ණ ගැන්වීමට අවස්ථාව දෙන්න.
- එය සැලැකිල්ලෙන් යුතුව අලංකාර ලෙස වර්ණ ගැන්වීමෙන් දෙවි පියාණන් වහන්සේට තුති පිදිය හැකි බව සිසුන්ට ඒත්තු ගන්වන්න.

**තක්සේරුව** : දෙවියන් වහන්සේ මැවූ ශරීරාංග අගය කරමින් තුති ගීයක් ගායනා කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- දෙවිඳුන් දුන් ශරීරය රැක ගැනීම හා අගය කිරීම

## 1.0 තේමාව : දෙවි පියාණන් වහන්සේ දුන් දීමනා

**1.0 නිපුණතාව : දෙවියන් වහන්සේ දුන් දීමනා සහ ලෝකය හඳුනා ගනියි, අගය කරයි, රැක ගනියි.**

**ඉගෙනුම් පල** : 1.2

- පොළොව, අව්ව හා වැස්ස දේව දීමනා බව පිළිගනිමින් දෙවිඳුන් හට තුති පිදීම සඳහා චිත්‍ර නිර්මාණය කරයි.

**ඉගෙනුම් සම්පත්** :
- ශුද්ධ බයිබලය - උත්පත්ති 1 : 1, 14, ගීතාවලිය 19 : 6, ජෝබ් 36 : 27 - 28
- කාඩ්බෝඩ්වලින් කපා සකස් කර ගත් හිරු පායා ඇති දර්ශනය සහිත පින්තූරයක් සහ වලාකුළකින් වැස්ස ඇද හැළෙන පින්තූරයක්

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :**

පියවර 1 :
- එළිමහනට සිසුන් කැඳවාගෙන යන්න.
- අවට පරිසරයේ හිරු පායා ඇති දර්ශනය දකින්නට සලස්වන්න.
- උදෑසන, දහවල, සවස හිරු එළියේ වෙනස හා සුන්දරත්වය පිළිබඳ සාකච්ඡා කරන්න.
- 'දූන් පොද වැස්සක් වැටුණොත්?' යන්න විමසා එහි ඇති අසිරිය ඉස්මතු කර පෙන්වන්න.
- 'ඔබ සිට ගෙන සිටින්නේ කොයි ද' යි අසමින් පොළොව කෙරෙහි අවධානය යොමු කරවන්න.
- අප ජීවිත කාලය ම ගත කරන්නේ මේ පොළොවේ බවත්, මේ මහ පොළොව අපට සම්පතක් බවත් පවසන්න.
- පොළොව, හිරු/හිරුරැස් සහ වැස්ස මවන ලද්දේ දෙවිඳුන් බව ප්‍රකාශ කරන්න.
- අර්ධ කවාකාර ව සිසුන් රඳවා හිරුගේ පින්තූරය සහ වැස්ස ඇද හැළෙන පින්තූරය පෙන්වා සාකච්ඡාවක් මෙහෙයවන්න.
    - **හිරු පායයි - අව්ව වැටෙයි - මල් සුපිපෙයි - ගස් නැළැවෙයි**
      **දෙවිඳුන් මේ හැම මැව්වේ අපට ආදරෙන්**
      **වැස්ස වසියි - පස සරු වෙයි - සිසිල දූනෙයි - ලොව සැනැසෙයි**
      **දෙවිඳුන් මේ හැම මැව්වේ අපට ආදරෙන්**

පියවර 2 :
- අදාළ බයිබල් පාඨ සිසුන්ට ඇසෙන සේ කියවන්න.
- පොළොව - අව්ව - වැස්ස ප්‍රයෝජනයට ගනිමින් කළ හැකි විවිධ දේ පිළිබඳ අදහස් විමසන්න.
- අව්ව හා වැස්ස දෙවිඳුන් දුන් දීමනා බව අගය කරමින් යැදුමක් ඉදිරිපත් කිරීමට සලස්වන්න.

**තක්සේරුව** : දෙවියන් වහන්සේ මැවූ පොළොව, අව්ව සහ වැස්ස අගයමින් ගීයක් ගායනා කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- පවුලේ යාච්ඤාවේ දී නියඟය පවතින ප්‍රදේශවලට වර්ෂාව ලැබෙන ලෙස දෙවිඳුන් යැදීම

## 1.0 තේමාව : දෙවි පියාණන් වහන්සේ දුන් දීමනා

**1.0 නිපුණතාව : දෙවියන් වහන්සේ දුන් දීමනා සහ ලෝකය හඳුනා ගනියි, අගය කරයි, රැක ගනියි.**

**ඉගෙනුම් ඵල** : 1.3

- සාමූහික නිර්මාණයක් සකස් කරමින් විවිධ මල් හා ගස් වැල් අපට ලබා දීම පිළිබඳ දෙවිඳුන්ට තුති පුදයි.
- දේව නිර්මාණය සුරැකීම සඳහා කටයුතු කළ හැකි අයුරු ප්‍රකාශ කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- ශුද්ධ බයිබලය - උත්පත්ති 1 : 11 - 13
- බ්‍රිස්ටල් බෝඩ් එකක් මත ඇඳ පුවරුවක අලවන ලද විශාල ගසක රේඛාමය චිත්‍රයක්
- තෙරපා වියළා ගත් මල් සහ ශාක පත්‍ර, වියළි පොල් කොළ වැනි ශාකයේ රූපය මත ඇලැවිය හැකි දේ

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :**

පියවර 1 :
- සිසුන් සමග ක්ෂේත්‍ර චාරිකාවක් සංවිධානය කර ගනිමින් පාසල් වත්ත හෝ සුන්දර ලෙස මල් වවා ඇති පරිසරයක් හෝ නැරඹීමට යන්න.
- දකින පරිසරයේ චමත්කාරය පිළිබඳ චාරිකාවේ දී නිරතුරුව කතා කරන්න.
- දෙවි පියාණන් වහන්සේගේ මැවීමේ අලංකාරය අත්විඳීමට සලස්වන්න.
- එම ගස් වැල් සුරැකිය යුතු ආකාරය පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- පරිසරයේ ඇති දේ පරිහරණයේ දී අන් අයටත් පරිසරයටත් ඉතිරි කරමින් අපට අවශ්‍ය ප්‍රමාණය පමණක් ලබා ගත යුතු බව ඒත්තු ගන්වන්න.
- චාරිකාවේ දී බිම වැටී ඇති මල් හා ශාක පත්‍ර වැනි විවිධ දේ එකතු කර ගැනීමට යොමු කරවන්න.

පියවර 2 :
- බයිබල් පාඨයේ අදහස සිසුන් සමග එක් ව සාකච්ඡා කරන්න.
- ගසෙහි රේඛාමය චිත්‍රය පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- එම ගසේ රූපය මත සිසුන් ගෙන ආ තෙරපා වියළා ගත් මල් සහ ශාක පත්‍ර, වියළි පොල් කොළ වැනි ද්‍රව්‍ය හෝ එකතු කර ගත් මල් හා පත්‍ර අලවමින් චිත්තාකර්ෂණීය ලෙස ගසක් නිර්මාණයට සිසුන් යොමු කරන්න. (සෑම සිසුවකුට ම අවස්ථාවක් ලැබෙන සේ)

පියවර 2 :
- පහත ගීතය සිසුන් සමග ගායනා කරමින් රස වින්දනයට අවස්ථාව දෙන්න.

**ගස් පිරිලා මල් ගොඩයි තුති දෙවිඳුන්ට යි**
**අප නෙළන්නෙ මල් ටිකයි ඉතිරිය ගසට යි**
**මුළු ගසේ ම මල් නෙළුවොත් ගසට දුක හිතෙයි**
**සමනලයට බඩගින්නේ ඉන්නට සිදු වෙයි**

- එහි අර්ථය සිසුන්ට පහදා දෙන්න.

**තක්සේරුව** : සාමූහික ව කොලාජ් ක්‍රමයට ගසක් නිර්මාණය කරමින් දෙවි පියාණන් වහන්සේට තුති පුදයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- ගස්වැල් රෝපණය කිරීම

## 2.0 තේමාව : දෙවි පියාණන් වහන්සේගේ ආදරය හා රැකවරණය

**2.0 නිපුණතාව : දෙවි පියාණන් වහන්සේගේ ආදරය හා රැකවරණය අත්දකියි, ප්‍රතිප්‍රේමය දක්වයි.**

**ඉගෙනුම් පල** : 2.1

- දෙවි පියාණන් වහන්සේගේ ආදරය අත්දැකීමට මග සලසන, දෙමාපියන් ගේ/ රැකබලා ගන්නන් වෙනුවෙන් තුති කාඩ් පතක් නිර්මාණය කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- කිතුනු ගීත හා අංක 573 ගීතිකාව 1, 6, 8 යන පද්‍ය
- කාඩ් පතක් නිර්මාණයට අවශ්‍ය දේ
- තැටි සහ වාදන යන්ත්‍රයක්

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය** : 2.1 දෙමාපියන් හා රැකබලා ගන්නන්ගේ ආදරය මගින්

පියවර 1 :

- ක්‍රිස්තියානි ගීතිකා පොතේ අංක 573 ගීතිකාවේ 1, 6 හා 8 පද වාදනය කරන්න.
- දෙවි පියාණන් වහන්සේගේ ආදරය පිළිබඳව ස්තුති කිරීම සඳහා රංගනයේ යෙදෙමින් එම ගීය ගායනා කරන්නට සිසුන් යොමු කරන්න.
  - **මේ ලොව ඇති සැම දේ ම මවා දුන් පිය දෙවිඳුන් හට (තුති දී වඳිමු) //**
    **පෙම්වත් මව්පිය අප රැක ගැනුමට දුන් පිය දෙවිඳුට (තුති දී වඳිමු) //**
    **සැමට ම ආදර වීමට සිත දුන් පිය දෙවිඳුන් හට (තුති දී වඳිමු) //**

පියවර 2 :

- දෙමවුපියන්/රැකබලා ගන්නන් පිළිබඳ සිසුන් සමග සුහද සාකච්ඡාවක යෙදෙන්න.
- ඔවුන් තමා රැකබලා ගන්නේ තමා කෙරෙහි ඇති ආදරය නිසා බව තේරුම් ගැනීමට සලස්වන්න.
- දෙමවුපියන් හා රැකබලා ගන්නන්ගෙන් අත්දකින්නේ දෙවි පියාණන් වහන්සේගේ ආදරය බව වටහා දෙන්න.
- දෙමවුපියන් හා රැකබලා ගන්නන් වෙනුවෙන් සිසු දරුවනට කළ හැකි උදව් උපකාර විමසන්න.
- එ සේ උදව් උපකාර කිරීම දේව ප්‍රේමයට ප්‍රතිචාර දැක්වීමක් බව ඒත්තු ගන්වන්න.
- තුති කාඩ්පතක් නිර්මාණය කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය ලබා දෙන්න.
- 'අම්මාට/තාත්තාට/...........ට ස්තුති යි' යනුවෙන් එම කාඩ් පතෙහි ඔබේ අකුරින් ලියා දෙන්න.

**තක්සේරුව** : තම දෙමවුපියන්/රැකබලා ගන්නන් ගෙන් ලබන ආදරය මෙනෙහි කරමින් ඔවුන් වෙනුවෙන් තුති කාඩ්පතක් නිර්මාණය කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- විශේෂ අවස්ථාවල දී වැඩිහිටියන් වෙනුවෙන් තුති කාඩ්පත් නිර්මාණය කිරීම

## 2.0 තේමාව : දෙවි පියාණන් වහන්සේගේ ආදරය හා රැකවරණය

**2.0 නිපුණතාව : දෙවි පියාණන් වහන්සේගේ ආදරය හා රැකවරණය අත්දකියි, ප්‍රතිප්‍රේමය දක්වයි.**

**ඉගෙනුම් පල** : 2.2

- දෙවි පියාණන් වහන්සේගේ ආදරය, රැකවරණය දැනෙන්නට සලස්වන, සහෝදර සහෝදරියන් පිළිබඳ අත්දැකීම් බෙදා ගනියි.

**ඉගෙනුම් සම්පත්** : • ඉරටුවල ගැසූ කඩදාසි මල් සෑදීමට අවශ්‍ය ද්‍රව්‍ය

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :**

පියවර 1 :
- තමාට ආදරය හා රැකවරණය ලබා දෙන සහෝදර සහෝදරියන් දෙවිඳුන් දුන් තිළිණයක් බව අවබෝධ වන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.
- 'අපි මලක් දී ඔවුන් සතුටු කරමු' යැ යි යෝජනා කරන්න.
- අවශ්‍ය ද්‍රව්‍ය ලබා දී සහෝදර සහෝදරියන් වෙනුවෙන් සුදුසු මල් සංඛ්‍යාවක් නිර්මාණය කරවන්න.
- එම මල් රැගෙන ගොස් සහෝදර සහෝදරියන්ට දීමට සිසුන් යොමු කරන්න. (සහෝදර සහෝදරියන් නොමැති නම් ඥාති සහෝදර සහෝදරියක වෙනුවෙන් මලක් නිර්මාණය කරවන්න

පියවර 2 :
- සාකච්ඡාවක් මගින් සහෝදර සහෝදරියන්ට ආදරය පෙන්විය හැකි අවස්ථා ඉස්මතු කරන්න.
  *නිද* : * සහෝදරයන්ට කරදරයක් සිදු වූ විට ඒ බව අම්මාට තාත්තාට දැන්වීම
  * රාත්‍රියේ නින්දට යන විට සුබ පැතීම
  * අසනීප වූ විට දී යාච්ඤා කිරීම
  * ලැබෙන රස ආහාරයක් බෙදා ගැනීම.
- සුදුසු සිසුන් දෙදෙනකු පන්තිය ඉදිරියට කැඳවන්න.
- තම සහෝදරයකු/සහෝදරියක ගෙන් උදව් ඉල්ලන්නට සිදු වන අවස්ථාවක් ඉදිරිපත් කරන්නටත්, එම උදව්ව සිදු කරන ආකාරය ඉදිරිපත් කරන්නටත්, අවස්ථාව දෙන්න.
- එසේ කියන්නට කැමැති අනෙක් සිසුන්ට ද අවස්ථාව දෙන්න.
- එම අවස්ථා ප්‍රයෝජනයට ගනිමින් සහෝදර සහෝදරියන්ගේ ආදරය හා රැකවරණය අගය කරන්නට හුරු කරවන්න.

**තක්සේරුව** : සහෝදර සහෝදරියන්ගේ ආදරය හා රැකවරණය තමාට ලැබුණු අවස්ථා ප්‍රකාශ කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- සහෝදර සහෝදරියන් සමග ආදරයෙන් සහයෝගයෙන් හා එකමුතුව සිටීම

## 2.0 තේමාව : දෙව් පියාණන් වහන්සේගේ ආදරය හා රැකවරණය

**2.0 නිපුණතාව : දෙව් පියාණන් වහන්සේගේ ආදරය හා රැකවරණය අත්දකියි, ප්‍රතිප්‍රේමය දක්වයි.**

**ඉගෙනුම් පල** : 2.3

- දෙව් පියාණන් වහන්සේගේ ආදරය හා රැකවරණය හඳුනා ගැනීමට උපකාර වන නෑදෑ හිතමිතුරු චරිත, නිර්මාණාත්මක ව නිරූපණය කරයි.

**ඉගෙනුම් සම්පත් :**

- සෙල්ලම් ගෙයක්
- නෑදෑ හිතමිතුරු චරිත සඳහා ඇඳුම් පැළඳුම්
- තෑගි බෝග ලෙස ඔතා සකසා ගත් පෙට්ටි වැනි දේ

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :**

පියවර 1 :

- ඥාතීන්ගෙන් ලැබෙන ආදරය හා රැකවරණය පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවන්න.
- නෑදෑ හිතමිතුරන් ද දෙව් පියාණන් වහන්සේගේ තිළිණ බැවින් ඔවුන් ගෙන් ලැබෙන්නේ ද දේව රැකවරණය හා ආදරය බව අවබෝධ කරවන්න.

පියවර 2 :

- පන්තිය කණ්ඩායම්වලට බෙදා, සුදුසු චරිත ලබා දෙන්න.
- එක් කණ්ඩායමක් පවුලක් ලෙස සෙල්ලම් ගෙදර රඳවන්න.
- අනෙක් පවුල් නෑගම් යෑම නිරූපණය කරමින් තෑගි බෝග රැගෙන සෙල්ලම් ගෙදරට පිවිසීමට සලස්වන්න. (ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි නම් නිවසේ කිසියම් උත්සව අවස්ථාවක් ලෙස රංගනයට යොදා ගන්න.)
- පවුල් එකිනෙකාට සුහද ව ආමන්ත්‍රණය කරමින්, ආචාර කර පිළිගැනීමට සලස්වන්න.
- පවුල් දෙක තුළ හමු වූ ඥාති චරිත හඳුන්වා දෙන්න.

**තක්සේරුව** : විවිධ නෑදෑ හිතමිතුරු චරිත නිරූපණය කරමින් දෙව් පියාණන් වහන්සේගේ ආදරය අත්විඳියි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- සුහදව සහ ආදරයෙන් නෑදෑ හිතමිතුරන්ට සැලකීම

## 2.0 තේමාව : දෙව්පියාණන් වහන්සේගේ ආදරය හා රැකවරණය

**2.0 නිපුණතාව : දෙවි පියාණන් වහන්සේගේ ආදරය හා රැකවරණය අත්දකියි, ප්‍රතිප්‍රේමය දක්වයි.**

**ඉගෙනුම් පල** : 2.4

- දේව ප්‍රේමයට ප්‍රතිප්‍රේමය දැක්වීමක් වශයෙන් ගුරුතුමියට/ගුරුතුමාට ස්තුති පතක් නිර්මාණය කර පිළිගන්වයි.

**ඉගෙනුම් සම්පත්** : • ස්තුති පතක් සැදීමට අවශ්‍ය ද්‍රව්‍ය

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :**

පියවර 1 :
- තමා ගුරුතුමීට/ගුරුතුමාට ආදරය කරන්නේ ඇයි ද යන්න පිළිබඳ ව අදහස් ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ගුරුතුමී/ගුරුතුමා ද දරුවන්ට ඉතා ආදරය කරන බව ප්‍රකාශ කරන්න.
- පහත ගීතය සිසුන් සමග ගායනා කරමින් රස වින්දනයට අවස්ථාව දෙන්න.
  - **ගුරුතුමී මගේ ආදර මෑණී ම යි - මගෙ දියුණුව පතන**<br>**ගුරුතුමා පියාණන් - මගේ සදාදර මට ශිල්පය සදන**<br>**සුවපත් දීර්සායුෂ ම ලැබේ වා අදර ඔබට නිතින**<br>**ගුරු මාපියනට ජේසු සමිඳුගේ පිහිට පතමි බැතින**
- එහි අර්ථය සිසුන්ට පහදා දෙන්න.

පියවර 3 :
- ගුරුතුමී/ගුරුතුමා තමාට දක්වන ආදරය වෙනුවෙන් ආදරය ප්‍රකාශ කිරීම සඳහා ස්තුති පතක් නිර්මාණය කිරීමට සිසුන් යොමු කරන්න.
- එහි සිසුන් කැමති ඕනෑ ම චිත්‍රයක් අඳින ලෙස උපදෙස් දෙන්න.
- 'ගුරුතුමීට ආදරෙයි' යනුවෙන් ලියා සකස් කර ගත් කඩදාසි කැබැල්ලක් බැගින් සෑම ශිෂ්‍යයකුට ම ලබා දී එය එහි අලවන්නට උපදෙස් දෙන්න.
- එය ගෙදර ගෙන ගොස් දෙමාපියන්ට පෙන්වා ඒ ගැන ඔවුන්ට ද පැහැදිලි කර පසු දින ගුරුතුමීට දී සුබ පතන්නට අවස්ථාව දෙන්න.

**තක්සේරුව** : ස්තුති පතක් පිරිනැමීමෙන් ගුරුවරුන්ට ආදරය ප්‍රකාශ කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- ගුරුතුමියට/තුමාට ආදර ගෞරව දැක්වීම

## 3.0 තේමාව : දේව ප්‍රේමයට ප්‍රතිචාර දැක්වීම සඳහා දේව ගුණාංග ඇති කර ගැනීම

**3.0 නිපුණතාව : දේව ප්‍රේමයට ප්‍රතිචාර දක්වමින් යහපත් කිතුනු ගුණාංග වඩවා ගනියි.**

**ඉගෙනුම් පල** : 3.1

- ආදර්ශවත් කිතුනු දරුවකු ලෙස ජීවත් වෙමින් දේව ප්‍රේමයට ප්‍රතිචාර දක්වයි.
- නිරතුරුවම යහපත් ක්‍රියාවන්වලට යොමුවෙයි.
- යහපත් ගුණාංග ජීවිතයෙන් ප්‍රදර්ශනය කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- කිතුනු ගීත පොතේ 315 වන ගීතිකාව
- යහපත් ගුණාංග ලියූ කාඩ්පත් මල්ලක් හා කාඩ්පත් රඳවනයක්
- චිත්‍ර ඇඳීම සඳහා අවශ්‍ය උපකරණ

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :**

පියවර 1 : • කිතුනු ගී පොතේ 315 වන ගීතය (ඉවසිලිවන්තය කරුණාවන්තය.............) ගුරුතුමී විසින් ගායනා කරමින් හෝ සී. ඩී. තැටියක් මාර්ගයෙන් සිසුන්ට ශ්‍රවණය වීමට සලස්වන්න. එහි සඳහන් යහපත් ගුණාංග පිළිබඳව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

පියවර 2 : • සිසුන්ට නිවසේ දී හෝ පාසලේ දී කරන ලද යහපත් ක්‍රියා පිළිබඳව අදහස් පළ කිරීමට සලස්වා ඉන් එකක් චිත්‍රයට නැගීමට අවස්ථාව ලබා දෙන්න.

පියවර 3 : • යහපත් ගුණාංග ලියූ කාඩ්පත් සහිත මල්ල එක් එක් සිසුවා ළඟට ගෙන ගොස් එක් කාඩ්පත බැගින් ගැනීමට සලස්වා ඉදිරියට පැමිණ එය රඳවනය මත රැඳවීමට යොමු කරන්න. රැඳවූ පසු අත්පොළසන් නාදයක් ලබා දෙන්න.

පියවර 4 : • සිසුන් තුළ යහපත් ගුණාංග වර්ධනය කරන ලෙස අයැදිමින් සිසුන් සමඟ දෙවිඳුන් යදින්න.

**තක්සේරුව** : යහපත් ගුණාංග ප්‍රදර්ශනය කරමින් ආදර්ශවත් කිතුනු දරුවකු ලෙස හැසිරෙයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- යහපත් ක්‍රියා හා ගුණාංග එදිනෙදා ජීවිතය තුළ වර්ධනය කර ගනිමින් යහපත් කිතුනු දරුවකු වීමට නිරතුරුවම උත්සාහ කිරීම.

## 4.0 තේමාව : ජේසුස් වහන්සේ හඳුනා ගැනීම

### 4.0 නිපුණතාව : ජේසුස් වහන්සේ හඳුනා ගනියි, අනුගමනය කරයි.

**ඉගෙනුම් පල** : 4.1

- මරිය තුමිය ලද දේව පණිවුඩයෙන් දේව පුත්‍රයා වූ ජේසුස් වහන්සේ හඳුනා ගනිමින් නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙයි.

**ඉගෙනුම් සම්පත්** :

- ශුද්ධ බයිබලය (ලූක් 1:31)
- මරියතුමිය හා දේව දූතයා ගේ චරිතය නිරූපණය වන ඇඳුම් පැළඳුම්
- කොලාජ් නිර්මාණයට අවශ්‍ය දෑ

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :**

පියවර 1 :

- පෙර දැනුම් දීමකින් මරියතුමිය හා දේව දූතයාගේ චරිත නිරූපණය සඳහා සුදුසු සිසුන් දෙදෙනකු සූදානම් කරන්න.
- දේව දූතයා විසින් මරියතුමියට ජේසුස් වහන්සේගේ උපත පිළිබඳ පණිවුඩය ප්‍රකාශ කරන ආකාරය පන්තිය ඉදිරියේ රඟ දැක්වීමට සලස්වන්න.
- මරිය තුමිය එම පණිවුඩයට දැක්වූ ප්‍රතිචාරය ප්‍රකාශ කිරීමට සලස්වන්න.
- දේව කැමැත්තට කීකරු වීමේ අගය වටහා දෙන්න.
- රඟ දැක් වූ නාට්‍යය යොදා ගෙන මරියතුමිය ලද දේව පණිවුඩයෙන් දේව පුත්‍රයා වූ ජේසුස් වහන්සේ හඳුනා ගැනීම සම්බන්ධ සාකච්ඡාවක් මෙහෙයවන්න.

පියවර 2 :

- ශුද්ධවර ලූක් 1:31 පිළිබඳ මග පෙන්වන්න.
- **'ජේසුස් වහන්සේ'** යන නාමය ලියන ලද $A_4$ කඩදාසි ලබා දී කොලාජ් ක්‍රමයට එය සැරසීමට සිසුන් යොමු කරන්න.

**තක්සේරුව** : කොලාජ් ක්‍රමයට 'ජේසුස් වහන්සේ' යන නාමය නිර්මාණය කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- දේව කැමැත්තට කීකරු වීම

## 4.0 තේමාව : ජේසුස් වහන්සේ හඳුනා ගැනීම

### 4.0 නිපුණතාව : ජේසුස් වහන්සේ හඳුනා ගනියි, අනුගමනය කරයි.

**ඉගෙනුම් පල** : 4.2

- අප වෙනුවෙන් ජේසුස් වහන්සේ මෙලොවට පැමිණි බව ප්‍රකාශ කරමින් නත්තල් ගීතිකාවක් ගායනා කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- ශුද්ධ වූ බයිබලය (ශු. ලූක් 2:4 - 7) බයිබල් පාඨය
- ගව ලෙනක ආකෘතියක්
- ක්‍රිස්තියානි ගීතිකා පොතේ 592 වන ගීතිකාව

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :** 4.2 ජේසු උපත

පියවර 1 :

- සිසුන්ගේ සහයෝගය ඇති ව පිදුරු ඇතිරූ ගව ලෙනක් තුළ බිළිඳු ජේසුස් වහන්සේගේ රූවක් තබන්න.
- ජේසුස් වහන්සේගේ උත්පත්තිය කථාවක් ලෙස ඉදිරිපත් කරන්නට සිසුන්ට අවස්ථාව දෙන්න.
- ගුරු සහයෝගය සපයමින් සුදුසු පරිදි කතාව සම්පූර්ණ කරන්න.

පියවර 2 :

- ජේසුස් වහන්සේගේ උපත පිළිබඳ කියැවෙන ගීතිකාවක් සාමූහික ව ගායනා කිරීමට ඉඩ සලසන්න. (ක්‍රිස්තියානි ගීතිකා පොතේ 592 වන ගීතිකාව මේ සඳහා භාවිත කළ හැකි ය.)

1. **බෙත්ලෙහෙමේ ගව මඩුවේ - අප ජේසුස් බිළිඳා**
   **රෙදි ඔතලා එහි බාවා - ගව ඔරුවේ සිටිනා**
   **තරු අහසේ දිලිසෙමිනේ - එතුමා දෙස බැලුවේ**
   **අප ස්වාමී බිළිඳා වී - නිදි කරවා සිටියේ**

2. **එහි ගවයන් හඬ අසමින් - එතුමා ඇස් ඇරියේ**
   **බිය නො වෙමින් ප්‍රිය මුහුණින් - හිමි නාඩා සිටියේ**
   **මගෙ ප්‍රේමය - ඔබගේ ම ය - බලමින් මා අහසින්**
   **රෑ කාලේ නිදි වේලේ - අදරින් මා සුරකින්**

**තක්සේරුව** : ජේසුස් වහන්සේගේ උපතට අදාළ ගීතිකාවක් සාමූහික ව ගායනා කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- නත්තල වෙනුවෙන් ගව ලෙනක් නිර්මාණය කිරීම

## 4.0 තේමාව : ජේසුස් වහන්සේ හඳුනා ගැනීම

## 4.0 නිපුණතාව : ජේසුස් වහන්සේ හඳුනා ගනියි, අනුගමනය කරයි.

**ඉගෙනුම් පල** : 4.3

- ජේසුස් වහන්සේ භක්තියෙන් නමදියි.
- එඬේරුන්ගේ හා ශාස්ත්‍රවන්තයන්ගේ කතාවලට සතුටු සිතින් සවන් දෙමින් ආදර්ශයක් ලබයි.

**ඉගෙනුම් සම්පත්** :

- ශුද්ධ බයිබලය - ශු. මතෙව් 2 : 7 - 12, ශු. ලූක් 2 : 8 - 20
- මේසයක් මත ගව මඩුවක්, ගව ඔරුවක සිටින බිළිඳු ජේසුස් වහන්සේ, මරියතුමී හා ජෝසප් තුමා සහිත දර්ශනය
- සෑම ශිෂ්‍යයකුට ම ලබා දීම සඳහා එඬේරුන්ගේ සහ ශාස්ත්‍රවන්තයන්ගේ ආකෘති
- ක්‍රිස්තියානි ගීතිකා පොතේ අංක 594 ගීතිකාව හෝ එම අර්ථය ඇති ගීතයක්

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :**

පියවර 1 :

- සිසුන් අඩ කවයක් ලෙස අසුන් ගන්වන්න.
- ගවමඩුව, රෙදිවලින් ඔතා, ගව ඔරුවක සිටින බිළිඳු ජේසුස් වහන්සේ, ඒ අසලින් මරියතුමී හා ජෝසප් තුමා නිරූපණය කෙරෙන ආකෘති තබන ලද මේසය සිසුන්ට නරඹන්නට සලස්වන්න.
- සිසුන්ට එඬේරුන්ගේ හා ශාස්ත්‍රවන්තයන්ගේ ආකෘති බෙදා දෙන්න.
- ශාස්ත්‍රවන්තයන් හා එඬේරුන් බිළිඳු ජේසු බැහැ දැකීමේ කතන්දරය සිසුන්ට පවසන්න.
- සිසුන්ට බෙදා දෙන ලද එඬේරුන් හා ශාස්ත්‍රවන්තයන්ගේ ආකෘති ප්‍රදර්ශන මේසයේ බිළිඳු ජේසුස් වහන්සේ අසල තැබීමට උපදෙස් දෙන්න.
- සිසුන්ට ඒ පිළිබඳ අදහස් පළ කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- සිසුන් සමග එක් ව ක්‍රිස්තියානි ගීතිකා පොතේ අංක 594 ගීතිකාව හෝ වෙනත් ගීයක් ගායනා කරන්න.

**තක්සේරුව** : බිළිඳු ජේසුස් වහන්සේ නැමදීමට පැමිණි අමුත්තන් නම් කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- නත්තල් දේව මෙහෙයේ දී පවුලක් ලෙස දෙවිඳුන් නැමදීම.

## 5.0 තේමාව : ජේසුස් වහන්සේ ගේ ජීවිතයේ සුවිශේෂී වටිනාකම්

**5.0 නිපුණතාව : ජේසුස් වහන්සේ ගේ ජීවිතයේ සුවිශේෂ වටිනාකම් හඳුනා ගනියි.**

**ඉගෙනුම් පල** : 5.1

- ප්‍රාතිහාර්ය සිදු කරන ජේසුස් වහන්සේ පිළිබඳ විශ්වාසයෙන් යුතු ව අදහස් දක්වයි.

**ඉගෙනුම් සම්පත් :**

- ශුද්ධ බයිබලය (ශුද්ධ ජොහන් 6 : 1 - 14)
- 'පන්දහසකට කන්න දීම' චිත්‍ර කතාවේ රූප පෙළ
- ඉදිරියේ වැලක් ඇදීමට සුදුසු පටියක්
- චිත්‍ර ඇඳීමට සහ අවශ්‍ය දේ සහ කතුරු

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :**

පියවර 1:

- පටිය යොදා ගනිමින් පන්තිය ඉදිරිපස වැලක් අදින්න.
- සුදුසු පරිදි සිසුන් අසුන් ගන්වන්න.
- ශුද්ධ බයිබල් පාඨයට අනුව '**පන්දහසකට කන්න දීම**' චිත්‍ර කථාවේ, පළමු වන රූප රාමුව ශිෂ්‍යයකුගේ සහයෝගය ඇති ව වැලෙහි එල්ලන්න.
- කතාව දන්නා ශිෂ්‍යයකු සිටී නම් එම සිද්ධිය ඉදිරිපත් කරන්නට අවස්ථාව දෙන්න.
- අඩුපාඩු සම්පූර්ණ කරමින් කතාව සිත් ඇද ගන්නා අයුරින් කියන්න.
- මෙ ලෙස රූප රාමු සියල්ලක් ම වැලෙහි එල්ලමින් කතාව ඉදිරිපත් කරන්න.
- එ මගින් 'ප්‍රාතිහාර්ය සිදු කරන ජේසුස් වහන්සේ' පිළිබඳ සිසුන් තුළ විශ්වාසය ගොඩ නගන්න.

පියවර 2 :

- එළිමහනේ කවයක් ලෙස සිසුන් සිටුවන්න.
- පහත ගීය කියමින් අත්වැල් අල්ලා ගෙන රිද්මානුකූල ව රවුමේ යන්නට සිසුන්ට අවස්ථාව දෙන්න.

**රොටී පහ යි, මාළු දෙක යි, පොඩිත්තෙක් අතේ**
**තිබී එදා දුන්න ජේසු අතට සන්තොසේ**
**ආශීර්වාද කළාට පසු කෑලි කඩාලා**
**පන් දහසක් දෙනා ගෙ කුස ගින්න නිවාලා**

**තක්සේරුව** : ජේසුස් වහන්සේ කළ ප්‍රාතිහාර්යය විස්තර කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- ජේසුන් වහන්සේට මහත් දේ කිරීම සඳහා 'පිදීමේ හදවතක්' තමන් තුළ ජනිත කරවන ලෙස, පවුලේ යාච්ඤාවේ දී අයැදීම.

## 5.0 තේමාව : ජේසුස් වහන්සේ ගේ ජීවිතයේ සුවිශේෂ වටිනාකම්

**5.0 නිපුණතාව : ජේසුස් වහන්සේගේ ජීවිතයේ සුවිශේෂ වටිනාකම් හඳුනා ගනියි.**

**ඉගෙනුම් පල** : 5.2

- දෙවි පියාණන් වහන්සේට පෞද්ගලික ව යාච්ඤා කිරීම සඳහා ජේසුස් වහන්සේ ගේ යාච්ඤා ජීවිතයෙන් මග පෙන්වීමක් ලබයි.

**ඉගෙනුම් සම්පත්** :
- ශුද්ධ බයිබලය (ශු. මාර්ක් 1 : 35)
- කුඩා දරුවකු යාච්ඤා කරන පින්තූරයක්

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :**

පියවර 1 :
- පාසල් වත්තේ නිහඬ පරිසරයකට සිසුන් ගෙන යන්න.
- සුදුසු පරිදි සිසුන් භාවනාවකට සූදානම් කරන්න.
- කුඩා දරුවකු දෑත් එක් කොට යාච්ඤා කරන රූපය ප්‍රදර්ශනය කරන්න.

පියවර 2 :
- භාවනාත්මක කෙටි ගීතිකාවකින් සිසු අවධානය යොමු කර ගන්න.
- ගීතිකාව අවසානයේ දී යාච්ඤාවෙන් යුක්ත ව සිට, ශු. මාර්ක් 1,35 බයිබල් පදය ඉදිරිපත් කරන්න.
- ජේසුස් වහන්සේ තම පියාණන් වහන්සේට කථා කළේ යාච්ඤාවෙන් බව, බයිබල් පදය ඇසුරෙන් පැහැදිලි කරන්න.

පියවර 3 :
- සිසුන් කැමති ඉරියව්වකින් යාච්ඤා කිරීමට ඉඩ හරින්න.

පියවර 4 :
- මග පෙන්වීමක් මගින්, පොදු යාච්ඤාවකට සිසුන් සහභාගි කරවන්න.

**තක්සේරුව** : පෞද්ගලික ව යාච්ඤාවේ යෙදෙයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- තම දවස උදාවීමත් සමග ම තනි ව යාච්ඤා කිරීම

## 6.0 තේමාව : ශුද්ධාත්මයාණන් වහන්සේ

**6.0 නිපුණතාව : ශුද්ධාත්මයාණන් වහන්සේ හඳුනා ගනියි.**

**ඉගෙනුම් පල** : 6.1

- ශුද්ධාත්මයාණන් වහන්සේ හඳුනා ගනිමින් එකමුතු ව ප්‍රශංසා ගීතයක් ගායනා කරයි.

**ඉගෙනුම් සම්පත් :**
- ශුද්ධ බයිබලය රෝම 8 : 26 A , ගලති 5 : 16 A
- දැල්වීමට සූදානම් කළ පහනක් (හෝ ආරක්ෂිත ඉටි පහනක්)
- කෙටි ගීතිකාව

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :** ශුද්ධාත්මයාණන් වහන්සේ

පියවර 1 :
- සිසුන් කවයක් ලෙස වාඩි කරවන්න.
- කවය මැද මැටි පහන දල්වන්න.
- ඉතා භක්තියෙන් යුතු ව බයිබල් කොටස කියවන්න.
- එම වචන ඇසුරෙන් ශුද්ධාත්මයාණන් වහන්සේ පිළිබඳ සාකච්ඡාවකට යොමු වන්න.
- ශුද්ධාත්මයාණන් වහන්සේ නො පෙනෙන නමුත් අප සමග වැඩ සිටින බව පවසන්න.

පියවර 2 :
- සිසුන් ශ්‍රවණය කළ ගීතිකාව තාලයට සිසුන් සමග ගායනා කරන්න.

1. **ශුද්ධාත්මයාණෝ ලෝ (වැඩ වසයි) //**
   **ශුද්ධාත්මයාණෝ ලෝ වැඩ වසයි**
   **මා තුළත් වැඩ වසයි**

2. **ශුද්ධාත්මයාණෝ බෝ (මග පෙන්වයි) //**
   **ශුද්ධාත්මයාණෝ බෝ මග පෙන්වයි**
   **ප්‍රේමයෙන් මග පෙන්වයි**

3. **ශුද්ධාත්මයාණන්ට (ප්‍රශංසා වේ) //**
   **ශුද්ධාත්මයාණන්ට ප්‍රශංසා වේ**
   **ප්‍රශංසා වේ ප්‍රශංසා වේ**

(තනුව - ගැලවුම් කාරයා බලවත් ය කෙටි ගීතිකාව අනුව ගයන්න.)

**තක්සේරුව :** ශුද්ධාත්මයාණන් වහන්සේ පිළිබඳ ගීතය තාලයට ගායනා කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- සියලු කටයුතුවල දී ශුද්ධාත්ම මග පෙන්වීම් සොයමින් යාච්ඤා කිරීමට යොමු වීම

## 7.0 තේමාව : දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ක්‍රියා කිරීම

### 7.0 නිපුණතාව : දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ක්‍රියා කරයි.

**ඉගෙනුම් පල** : 7.1

- සමගියෙන් ජීවත් වීම සඳහා යහපත් සමාරිතානුවරයාගේ උපමාවෙන් මග පෙන්වීමක් ලබයි.

**ඉගෙනුම් සම්පත් :**

- ශු. බයිබලය (ශු. ලූක් 10.30 - 37)
- යහපත් සමාරිතයාගේ උපමාව දැක්වෙන චිත්‍ර
- උපමා කථාවෙහි ඇති විවිධ අවස්ථා ඇතුළත් රූප කට්ටල (සෑම ශිෂ්‍යයකුට ම එක් කට්ටලයක් බැගින්)

  රූප - පූජකයා, ලෙවීයයා, සමරිතානුවරයා, මෘගයා (කොටළුවා), තානායම
- ෆ්ලැනල් පුවරුව

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :**

පියවර 1 :

- සමාරිතයා උපමා කථාව කියමින් අදාළ සිදුවීම් පෙළ ෆ්ලැනල් පුවරුව මත පියවරෙන් පියවර ප්‍රදර්ශනය කරන්න. (කතාව දන්නා සිසුන් සිටින්නේ නම් ඔවුන්ට සුදුසු පරිදි අවස්ථාව දෙන්න.)
- සිසුන්ට පින්තූර කට්ටල බෙදා දී කථාවේ දැක්වෙන පූජකයා, ලෙවීයයා, සමාරිතයා, මෘගයා (කොටළුවා), තානායම පෙළ ගැස්වෙන පරිදි පොතේ ඇලවීමට යොමු කරන්න.

පියවර 2 :

- එදා සමාජයේ සමාරිතානුවරුන් ප්‍රතික්ෂේප කළ ද ඔහුගේ ක්‍රියාවෙන් එකිනෙකා අතර පැවතිය යුතු සමගිය ඉතා වටිනා බව තහවුරු කරන්න.
- කිසිවකුටත් හිරිහැර නොකර ලෝකයේ සිටින සියලු දෙනා සමග සමගියෙන් ජීවත් වීම දේව දරුවකුගේ ලක්ෂණයක් බව ඒත්තු ගන්වන්න.
- සිසුන් සමග සාමූහික ව පහත කවිය ගායනා කරන්න.

  - **මට හිරිහැර කරනවාට කැමති නෑ මෙමා**
    **අනිත් අයත් හිරිහැරයට කැමති නෑ තමා**
    **සතුටු නො වෙමි කිසි දැසක් කඳුළකින තෙමා**
    **ජේසු සමිඳු වාගේ වෙමු පුංචි අපි සැමා**

**තක්සේරුව** : යහපත් සමාරිතයාගේ කථාව ප්‍රකාශ කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- දේව දරුවන් ලෙස, එකිනෙකා සමග සමගියෙන් ජීවත් වීම

## 7.0 තේමාව : දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ක්‍රියා කිරීම

7.0 නිපුණතාව : දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ක්‍රියා කරයි.

**ඉගෙනුම් පල** : 7.2

- යහපත් සමාරිතයා අසරණ ව සිටි ජුදෙව් මිනිසා සමග තමා සතු දෑ බෙදා ගත් අයුරු රඟ දැක්වීමෙන් තමා සතු දෑ අන් අය සමග බෙදා ගැනීමට හුරුවක් ලබයි.

**ඉගෙනුම් සම්පත්** :

- ශු. බයිබලය- ලූක් 10.33 - 35
- තෙල් හා මිදි යුෂ (හෝ ඊට ආදේශකයක්), තුවාල බැඳීමට පටියක් සහ මුදල් අඩංගු මල්ලක්

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :**

පියවර 1 :
- පෙරදින ඉගෙන ගත් යහපත් සමාරිතයාගේ උපමා කතාව මතක් කර දෙන්න.
- යහපත් සමාරිතයා පාරේ වැටී සිටි අසරණ මිනිසා සමග බෙදා ගත් දේ පිළිබඳ සාකච්ඡා කරන්න.

පියවර 2 :
- සිද්ධියේ දැක්වෙන පරිදි අදාළ චරිත රඟපෑමට කැමති සිසුන් කැඳවන්න.
- සමාරිතයා, වැටී සිටි මිනිසාට තෙල් හා මිදි යුෂ ගල්වා, තුවාල බැඳ, තම මෘගයා පිට හිඳුවා තානායමට ගෙන ගොස් තම මුදල් ද ඔහු වෙනුවෙන් වැය කළ ආකාරය රඟ දැක්වීමට යොමු කරවන්න.
- ඔවුන් සමග කතාබහ කරන්නට අනෙක් සිසුන්ට අවස්ථාව දෙන්න.

තක්සේරුව : සමරිතානුවරයා තමා සතු දෑ අසරණ වී වැටී සිටි මිනිසා සමග බෙදා ගත් ආකාරය විස්තර කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- එදිනෙදා ජීවිතයේ දී තමාට ලැබෙන ත්‍යාග අන් අය සමග බෙදා ගැනීම

## 7.0 තේමාව : දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ක්‍රියා කිරීම

## 7.0 නිපුණතාව : දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ක්‍රියා කරයි.

**ඉගෙනුම් පල** : 7.3

- භේද නො තකා එකිනෙකා රැකබලා ගැනීමට පුරුදු වෙයි.

**ඉගෙනුම් සම්පත් :**

- ශුද්ධ බයිබලය, ශු. ලූක් 10 : 35 - 37
- ගීතිකාව

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :**

පියවර 1 :

- යහපත් සමාරිතයාගේ උපමාව තුළ අඩංගු වූ 'රැකබලා ගැනීම' පිළිබඳ අවස්ථා ඉස්මතු කර පෙන්වන්න.
- භේද නො තකා අද සමාජය තුළ එකිනෙකා රැකබලා ගන්නා අවස්ථා පිළිබඳ සිද්ධි සිසුන්ට ඉදිරිපත් කරන්න.
- එ වැනි සිද්ධියක් දෙමාපිය වැඩිහිටියන් ගෙන් අසා දැන ගෙන එන ලෙස සිසුන්ට උපදෙස් දෙන්න.
- $A_4$ කඩදාසි ලබා දී එම සිද්ධිය චිත්‍රයට නැඟීමට අවස්ථාව දෙන්න. (නම ද ලියවන්න.)
- චිත්‍ර සියල්ල එකතු කොට පොතක් ලෙස සකසා 'අපි එකිනෙකා රැකබලා ගනිමු' යැයි ලියූ කවරයක් යොදන්න.

පියවර 2 :

- භේද නො තකා එකිනෙකා රැකබලා ගැනීම පිළිබිඹු වන පහත සඳහන් කෙටි ගීතිකාව සිසුන් සමග ගායනා කරන්න.
  - 'පුංචි බබාලා - දැත් විදාලා
    පාද තබාලා - හා...යි එන්න නටාලා

    බේද නෑ අපි - රණ්ඩු නෑ අපි
    ජේසු තුරුල්ලේ - හා...යි
    සතුටු වෙමු අපි '

තක්සේරුව : භේද නො තකා එකිනෙකා රැකබලා ගැනීම පිළිබඳ සිද්ධියක් ඇඳ පෙන්වයි.

ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා

- ජාති, කුල, වර්ණ, ආගම්, දුප්පත්, පොහොසත්, බේද නො තකා එකිනෙකා රැකබලා ගැනීම

## 8.0 තේමාව : ශුද්ධ බයිබලය ජීවිතයට අදාළ කර ගැනීම

**8.0 නිපුණතාව : ශුද්ධ බයිබලයට අනුව දිවි ගෙවයි.**

**ඉගෙනුම් පල** : 8.1

- දේව ප්‍රශංසාව උදෙසා දෙවියන් වහන්සේ දී ඇති හැකියා වර්ධනය කර ගනිමින් දාවිත් සේ සතුටින් වාදනයේ යෙදෙයි.

**ඉගෙනුම් සම්පත් :**

- ශුද්ධ බයිබලය - 1 ෑ සාමුවෙල් 16 ෑ 17-23, ගීතාවලිය 145 ෑ 1 - 7
- කෙටි ගීතිකාවක් (සිසුන් දන්නා වූ)
- දාවිත් බැටළුවන් සමග වාඩි වී වීණා වාදනය කරන චිත්‍රයක්
- පොල් කටු, හැඳි, ටින් (වැනි ආදේශ සංගීත භාණ්ඩ)

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :**

පියවර 1:

- එළිමහනේ සුදුසු තැනකට සිසුන් ගෙන යන්න.
- දාවිත් වීණා වාදනය කරන චිත්‍රය ප්‍රදර්ශනය කරන්න.
- සිසුන් රැගෙන විත් ඇති භාණ්ඩ කෙටි ගීතිකාවක තාලයට වාදනය කිරීමට සිසුන්ට අවස්ථාව සලසන්න.
- ශුද්ධ ලියවිලි කොටස් තුළ පවතින හරයන් සිසුන්ට ඉදිරිපත් කරන්න.
- ඒ ඇසුරෙන් සාකච්ඡාවකට පිවිසෙන්න.
- දෙවියන් වහන්සේ විවිධ හැකියා දී ඇති බව අවබෝධ කරවන්න.
- දාවිත් තම ළමා කාලයේ දී හැකියා මගින් දෙවියන් වහන්සේට ප්‍රශංසා කළ බව පහදා දෙන්න.
- දෙවියන් වහන්සේ එක් එක් සිසුවාට ලබා ඇති හැකියාවන් ඉස්මතු කරමින් සාකච්ඡාව ඉදිරියට ගෙනයන්න.

**තක්සේරුව** : ආදේශ භාණ්ඩ භාවිතයෙන් කෙටි ගීතිකාවක තාලය වාදනය කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- තම හැකියාවන් දේව මහිමය සඳහා යොමු කිරීම

## 8.0 තේමාව : ශුද්ධ බයිබලය ජීවිතයට අදාළ කර ගැනීම

**8.0 නිපුණතාව : ශුද්ධ බයිබලයට අනුව දිවි ගෙවයි.**

**ඉගෙනුම් පල** : 8.2

- 'ජේසුස් වහන්සේ සුවයේ දිව්‍ය වෛද්‍යවරයාණන් ය' යන විශ්වාසයෙන් යුතු ව රෝගීන් වෙනුවෙන් යාච්ඤාවේ යෙදෙයි.

**ඉගෙනුම් සම්පත් :**
- ශුද්ධ බයිබලය (ශු. ජොහන් 4 : 46-51)
- රාජ්‍ය නිලධරයකු සේ සැරසුණු කෙනෙක්
- චිත්‍ර ඇඳීමට අවශ්‍ය දේ

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :**

පියවර 1 :
- කලින් සූදානම් කර ගත් ලෙසට රාජ්‍ය නිලධාරියකු ලෙස සැරසුණු කෙනකු පන්තියට ගෙන්වන්න.
- ඔහු පන්තියට හඳුන්වා දෙන්න.
- පහත තොරතුරු ඇතුළත් ව රාජ්‍ය නිලධරයාට ආත්ම කථනයක යෙදීමට ඉඩ හරින්න.
  * තම පුත්‍රයා අසනීප ව සිටි බව
  * ජේසුස් වහන්සේගෙන් සුවය ඉල්ලා පැමිණි බව
  * ජේසුස් වහන්සේ "පිටත්ව යන්න" යැ යි කියූ විට තමා කීකරු ව හැරී ගිය බව
  * එසේ යන අතර දරුවාට සුව වී ඇතැ යි පණිවුඩය ලැබුණු බව
- රාජ්‍ය නිලධරයා සමග සිසුන්ට සංවාදයක් පැවැත්වීමට අවස්ථාව සලස්වන්න.
- 'ජේසුස් වහන්සේ සුවයේ දිව්‍ය වෛද්‍යවරයාණන්' බව සිසුන්ට ඒත්තු ගැන්වෙන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

පියවර 2 :
- අසල්වැසි නිවෙස්වල අසනීප ව සිටින අය පිළිබඳ සිසුන් ගෙන් තොරතුරු විමසන්න.
- ඒ අය වෙනුවෙන් සාමූහික ව යාච්ඤාවේ යෙදෙන්නට මග පෙන්වන්න.

**තක්සේරුව** : රාජ්‍ය නිලධරයාගේ පුත්‍රයා සුව කිරීමේ කථාන්දරය මතකයෙන් කියයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- අසනීප අය වෙනුවෙන් පවුලේ යාච්ඤාවේ දී යාච්ඤා කිරීම

## 8.0 තේමාව : ශුද්ධ බයිබලය ජීවිතයට අදාළ කර ගැනීම

## 8.0 නිපුණතාව : ශුද්ධ බයිබලයට අනුව දිවි ගෙවයි.

**ඉගෙනුම් පල** : 8.3

- ජේසුස් වහන්සේ මරණින් උත්ථාන වූ දෙවි සමිඳුන් බව විශ්වාස කරයි.

**ඉගෙනුම් සම්පත් :**
- ශුද්ධ බයිබලය (ශු. මතෙව් 28 : 1 - 8)
- බ්‍රිස්ටල් බෝර්ඩ්, පාට, ගම්, කතුරු, පාටකොළ

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :**

පියවර 1 : ධනවතා සහ ලාසරස්

- ජේසුන් වහන්සේගේ පුනරුජ්ජීවන කතාව සිසුන්ට රසවත් ව ඉදිරිපත් කරන්න.
  - * සතියේ පළමුවන දින ස්ත්‍රීන් සොහොන වෙත ගිය බව.
  - * දේවදූතයෙක් ඔවුන්ට දර්ශනය වූ බව.
  - * උන්වහන්සේ උත්ථාන වූ බව පැවසීම.
  - * ස්ත්‍රීන් එය විශ්වාස කිරීම.

පියවර 2 : • බ්‍රිස්ටල් බෝඩ්, පාට කොළ ආදිය සපයා දී හිස් වූ සොහොනක ආකෘතියක් නිර්මාණය කිරීමට මග පෙන්වන්න.

පියවර 3 : • සිසුන් සමග එක් ව පහත සඳහන් ගීතය ගායනා කරන්න.

- **උත්ථාන වූ ජේසුනී - ඔබට පැසසුම් පුදන්නෙමි**
  **ජීවනෙ අධිපති වූ - ඔබට පැසසුම් පුදන්නෙමි**
  **හාලෙලූයා - හෝසන්නා** ////

තක්සේරුව : නැවත නැගිටි ජේසුස් වහන්සේට ස්තුති කරමින් ගීතිකාව ගයයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- මරණය පරදා, නැවත නැගිටි ජේසුස් වහන්සේට තුති පුදමින් යාච්ඤා කිරීම.

# තක්සේරු කිරීම

# ක්‍රිස්තියානි ධර්මය තක්සේරු කිරීමේ පත්‍රිකාව

| | | | | | | ඉගෙනුම් ඵල |
|---|---|---|---|---|---|---|
| | | | | | | ප්‍රවීණතා මට්ටමට පැමිණ ඇත. ✓<br>ප්‍රවීණතා මට්ටමට පැමිණ නැත. • |
| | | | | | | 1. දෙවියන් වහන්සේ මැවූ ශරීරාංග අගය කරමින් තුති ගීයක් ගායන කරයි. |
| | | | | | | 2. දෙවියන් වහන්සේ මැවූ පොළොව, අව්ව සහ වැස්ස අගයමින් ගීයක් ගායනා කරයි. |
| | | | | | | 3. සාමූහික ව කොලාජ් ක්‍රමයට ගසක් නිර්මාණය කරමින් දෙව් පියාණන් වහන්සේට තුති පුදයි. |
| | | | | | | 4. තම දෙමවුපියන්/රැකබලා ගන්නන් ගෙන් ලබන ආදරය මෙනෙහි කරමින් ඔවුන් වෙනුවෙන් තුති කාඩ්පතක් නිර්මාණය කරයි. |
| | | | | | | 5. සහෝදර සහෝදරියන් ගේ ආදරය හා රැකවරණය තමාට ලැබුණු අවස්ථා ප්‍රකාශ කරයි. |
| | | | | | | 6. විවිධ නෑදෑ හිතමිතුරු චරිත නිරූපණය කරමින් දෙව් පියාණන් වහන්සේගේ ආදරය අත්විඳියි. |
| | | | | | | 7. ස්තුති පතක් පිරිනැමීමෙන් ගුරුවරුන්ට ආදරය ප්‍රකාශ කරයි. |
| | | | | | | 8. යහපත් ගුණාංග ප්‍රදර්ශනය කරමින් ආදර්ශවත් කිතුනු දරුවකු ලෙස හැසිරෙයි. |
| | | | | | | 9. දෙමාපියන් සමග එක් ව යහපත් කටයුතුවල නිරත වෙයි. |
| | | | | | | 10. දැහැමි ළමයකු සතු විය යුතු ලක්ෂණ නම් කරයි. |
| | | | | | | 11. කොලාජ් ක්‍රමයට 'ජේසුස් වහන්සේ' යන නාමය නිර්මාණය කරයි. |
| | | | | | | 12. ජේසුස් වහන්සේ කළ ප්‍රාතිහාර්යය විස්තර කරයි. |
| | | | | | | 13. පෞද්ගලික ව යාච්ඤාවේ යෙදෙයි. |
| | | | | | | 14. ශුද්ධාත්මයාණන් වහන්සේ පිළිබඳ ගීතය තාලයට ගායනා කරයි. |
| | | | | | | 15. යහපත් සමාරිතයාගේ කථාව ප්‍රකාශ කරයි. |
| | | | | | | 16. සමරිතානුවරයා තමා සතු දෑ අසරණ වී වැටී සිටි මිනිසා සමග බෙදා ගත් ආකාරය විස්තර කරයි. |
| | | | | | | 17. භේද නො තකා එකිනෙකා රැකබලා ගැනීම පිළිබඳ සිද්ධියක් ඇඳ පෙන්වයි. |
| | | | | | | 18. ආදේශ භාණ්ඩ භාවිතයෙන් කෙටි ගීතිකාවක තාලය වාදනය කරයි. |
| | | | | | | 19. රාජ්‍ය නිලධරයාගේ පුත්‍රයා සුව කිරීමේ කථාන්දරය මතකයෙන් කියයි. |
| | | | | | | 20. නැවත නැගිටි ජේසුස්වහන්සේට ස්තුති කරමින් ගීතිකාව ගයයි. |